# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,015 - 2017 අප්‍රේල් මස 12 වැනි බදාදා - 2017.04.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | — |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 340 |


*සැ. යු.* - පිළිකා සරණ භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2017 අප්‍රේල් මස 07 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 මැයි මස 05 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 අප්‍රේල් මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


339- B 081160 — 353 (2017/04)
D 1 -

# විවිධ දැන්වීම්

## දැන්වීමයි

(කොළඹ පිහිටි සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත්බද මහාධිකරණයේ දී ය

රාජගිරිය, නාවල පාර, අංක 593/1/1 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි මැක් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් Mac Trading (Private) Limited පිළිබඳව කාරණාවේ දී ය

නඩු අංකය : HC (Civil) 03/2017/CO.

2007 අංක 07 දරන සමාගම් පනතේ 270 (ඉ) වගන්තිය යටතේ මැක් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් Mac Trading (Private) Limited අධිකරණය මගින් ගණන් බේරා වසා දැමීම සඳහා සිදු කරනු ලබන ඉල්ලීම සම්බන්ධ කාරණාවේ දී ය.

(කොළඹ පිහිටි සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරන) බස්නාහිර පළාත්බද මහාධිකරණය වෙත ඉහත නම් සඳහන් මැක් ට්‍රේඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් Mac Trading (Private) Limited ගණන් බේරා වසා දමනු ලැබීම සඳහා ඔස්ට්‍රියාව 4614 මාච්ට්‍රෙන්ක්, 05, ගාට්නර්ස්ට්‍රෙස්හි දරන ස්ථානයේ හි පදිංචි ඇල්ෆ්‍රඩ් ඇන්ගලේන විසින් වර්ෂ 2017 මාර්තු මස 07 වැනි දින එකී අධිකරණය වෙත පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත්, එකී පෙත්සම වර්ෂ 2017 ජූලි මස 28 වැනි දින අධිකරණය ඉදිරියේ අඬගැසිය යුතු බවට නියම කරන ලද බවත්, එකී පෙත්සම මත නියෝගයක් කිරීම සම්බන්ධව සහයෝගය දක්වීමට හෝ විරෝධය දක්වීමට කැමති එකී සමාගමේ ණය හිමියෙකු හෝ දයකයෙකු එකී පෙත්සම අඬගසන වේලාවේ දී පුද්ගලිකව හෝ නීතිඥවරයෙකු හෝ ලේඛනගත නීතිඥවරයෙක් මගින් එම අරමුණ වෙනුවෙන් පෙනී සිටීමට හැකි බවත්, මෙයින් දන්වනු ලැබේ. තව ද, ඉහත කී පෙත්සමේ පිටපතක් ඒ සඳහා වන ගාස්තු ගෙවීම මත අවශ්‍ය වන සමාගමේ සිටි ණය හිමියෙකුට හෝ දයකයෙකුට පහත අත්සන් කරනු ලබන අය විසින් සපයනු ලබන්නේ ය.

නීතිඥ කේ. සුමින්ද පෙරේරා,
අංක 173/2A, විජය කුමාරතුංග මාවත, කොළඹ 05,
දුරකථන අංක : 011-4061665

එකී පෙත්සම අඬගැසීමේ දී අධිකරණයේ පෙනී සිටීමට අදහස් කරන යම් අයෙකු එසේ කිරීමට ඇති සිය අදහස ඉහත නම් සඳහන් නීතිඥ වෙත ලිඛිතව පැමිණ හෝ තැපැල් මගින් භාර දිය යුතු ය. පුද්ගලයාගේ හෝ ආයතනයේ නම සමග ලිපිනය නොතීසියේ සඳහන් කිරීමට අවශ්‍ය වන අතර, එම පුද්ගලයා විසින් හෝ ආයතනය විසින් හෝ පුද්ගලයා හෝ ආයතනයේ සිය නීතිඥවරුන් ඇත්නම් ඔවුන් විසින් හෝ අත්සන් කරනු ලැබීමට හා එය 2017 ජූලි මස 26 වැනි දින ප. ව. 1.00ට පෙර ඉහත නම් සඳහන් නීතිඥවරයාට ලැබෙන සේ කල්වේලා ඇතිව භාර දීමට හෝ තැපැල් කිරීමට අවශ්‍ය වේ.

පෙත්සම්කාර සමාගමේ ලේඛනගත නීතිඥ.

04-393

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.